සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# සබරගමුව පළාත් සභාවේ පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා උපාධිධාරීන් හා ඉංග්‍රීසි පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමාධාරීන් (සිංහල/දෙමළ මාධ්‍යය) බඳවා ගැනීමේ තරග විභාගය - 2017 (2018)

For More Past Papers
tamilguru.lk

## (02) සාමාන්‍ය දැනීම

පැ. එකයි

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :




✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**1 2 3 4**

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.

.....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

.....................................

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **06** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.

✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය එකකි.

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 9 | |
| 3 | 10 - 18 | |
| 4 | 19 - 27 | |
| 5 | 28 - 38 | |
| 6 | 39 - 50 | |
| එකතුව | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

- අංක 1 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

1. 2014 ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අනුව ගුරු වෘත්තියට බඳවා ගැනීමට සුදුසුකම් ලබන වයස් පරාසය කුමක් ද?
   (1) අවුරුදු 18–35 (2) අවුරුදු 20–36 (3) අවුරුදු 21–40 (4) අවුරුදු 24–40 (.........)

2. 1978 න් පසුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට අදාළ සියලු පත්වීම් හා උසස්කිරීම් කටයුතු ඉටුකිරීමට පැවරුණු ස්වාධීන කොමිෂන් සභාව කුමක් ද?
   (1) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2) උසස් අධ්‍යාපන කොමිෂන් සභාව
   (3) රාජ්‍ය සේවා කොමිෂන් සභාව (4) අධ්‍යාපන සේවා කොමිෂන් සභාව (.........)

3. ශ්‍රී ලංකාවේ ද සැමරුම් සිදුකෙරෙන ලෝක ගුරු දිනය යෙදී ඇත්තේ වර්ෂයේ කවර දිනයක ද?
   (1) ඔක්තෝබර් 1 (2) සැප්තැම්බර් 17 (3) ඔක්තෝබර් 6 (4) මාර්තු 8 (.........)

4. 1994 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ගුරු වෘත්තියේ සිදු වූ ප්‍රබල පරිවර්තනය කුමක් ද?
   (1) ගුරුවෘත්තියට ස්ථිර වැටුප් ක්‍රමයක් සැකසීම
   (2) ශ්‍රී ලංකා ගුරු සේවය පිහිටුවීම
   (3) ගුරු සේවාවට අදාළ වෘත්තීය සමිති පිහිටුවීම
   (4) පෞද්ගලික සේවයේ නිරතවීමට අවස්ථාව ලබාදීම (.........)

tamilguru.lk

5. චක්‍රලේඛයක් මගින් ශ්‍රී ලංකාවේ පාසල් ප්‍රියමනාප, ප්‍රියමනාප නොවන හා දුෂ්කර ලෙස වර්ග කර ඇත්තේ කවර ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැගීමට ද?
   (1) පාසල්වලට සිසුන් ඇතුළත් කර ගැනීමට (2) පාසල් නිල ඇඳුම් බෙදා දීමට
   (3) ළමා මිතුරු පාසල් සංවර්ධනයට (4) ජාතික ගුරුමාරු ක්‍රියාවට නැංවීමට (.........)

6. ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගන්නා අය තුළ වර්තමානයේ කැපීපෙනෙන ප්‍රවණතාව වන්නේ මින් කුමක් ද?
   (1) විවිධාකාර අධ්‍යාපන සුදුසුකම් ඇති අය නියෝජනය වීම.
   (2) ඉතා ඉහළ කාන්තා ප්‍රතිශතයක් නියෝජනය වීම.
   (3) පූර්ව සේවා පුහුණුවක් නොමැති වැඩි පිරිසක් නියෝජනය වීම.
   (4) විවිධ භාෂා මාධ්‍යවලින් ඉගැන්විය හැකි වැඩි පිරිසක් නියෝජනය වීම. (.........)

7. පාසලක 'දැක්ම' හා 'මෙහෙවර' අතර වෙනස කුමක් ද?
   (1) දැක්ම විදුහල්පතිගේ වගකීම වන අතර මෙහෙවර ගුරුවරයාගේ වගකීමකි.
   (2) දැක්ම ගුරු මණ්ඩලයේ ඉලක්කය වන අතර මෙහෙවර ශිෂ්‍ය ඉලක්කය වේ.
   (3) දැක්ම අනාගතයේ එළඹිය යුතු තත්ත්වය වන අතර මෙහෙවර පාසලේ වැඩකටයුතු කිරීමේ සැලැස්මයි.
   (4) දැක්ම පාසල පිළිබඳ ප්‍රජාව දකින ආකාරය වන අතර මෙහෙවර සැබෑ ක්‍රියාවලියයි. (.........)

8. ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා වඩාත්ම සුදුසු මූලාශ්‍රය වන්නේ කුමක් ද?
   (1) ආදර්ශ පිළිතුරු පත්‍ර (2) ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ
   (3) අදාළ විෂය පෙළපොත (4) විෂය නිර්දේශ (.........)

9. වර්තමානයේ නිලවශයෙන් ක්‍රියාත්මක වන පාසල් වර්ගීකරණය කුමක් ද?
   (1) ප්‍රාථමික, කණිෂ්ඨ ද්විතියික, ජ්‍යෙෂ්ඨ ද්විතියික හා ජාතික පාසල්
   (2) ග්‍රාමීය, වතු, අර්ධනාගරික හා 1 AB පාසල්
   (3) 1 AB, 1 C, දෙක වර්ගයේ හා තුන වර්ගයේ පාසල්
   (4) නාගරික, ප්‍රියමනාප, දුෂ්කර හා අතිදුෂ්කර පාසල් (.........)

For More Past Papers
tamilguru.lk

For More Past Papers
tamilguru.lk

10. පාසලක සිදුවන බොහෝ කටයුතු ආවරණයවන විෂයමාලා කාණ්ඩය කුමක් ද?
   (1) සදාචාර විෂයමාලාව, ශාස්ත්‍රීය විෂයමාලාව, අධ්‍යාපනික විෂයමාලාව
   (2) සැඟවුණු විෂයමාලාව, විෂය සමගාමී ක්‍රියා, විෂය බාහිර ක්‍රියා
   (3) අධ්‍යාපනික විෂයමාලාව, විෂය බාහිර ක්‍රියා, ශාස්ත්‍රීය විෂයමාලාව
   (4) සදාචාර විෂයමාලාව, ශාස්ත්‍රීය විෂයමාලාව, විෂය සමගාමී ක්‍රියා (.........)

11. ශ්‍රී ලංකාවේ රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය හා පාසල අතර ක්‍රියාත්මක වන පරිපාලන ස්තර හතර පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
   (1) පළාත් දෙපාර්තමේන්තුව, පළාත් අමාත්‍යාංශය, කලාප කාර්යාලය, කොට්ඨාස කාර්යාලය
   (2) පළාත් අමාත්‍යාංශය, පළාත් දෙපාර්තමේන්තුව, කලාප කාර්යාලය, කොට්ඨාස කාර්යාලය
   (3) අධ්‍යාපන දෙපාර්තමේන්තුව, පළාත් අමාත්‍යාංශය, කොට්ඨාස කාර්යාලය, පාසල් කළමනාකරණ මණ්ඩලය
   (4) පළාත් අමාත්‍යාංශය, පළාත් දෙපාර්තමේන්තුව, පරිශද කාර්යාලය, කොට්ඨාස කාර්යාලය (.........)

12. වර්තමාන ශ්‍රී ලංකාවේ සිදුවී ඇති වෙනස්කම් අනුව අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාව කුමක් ද?
   (1) අවුරුදු 5–18   (2) අවුරුදු 5–14   (3) අවුරුදු 6–18   (4) අවුරුදු 5–16 (.........)

13. රජයේ පාසල්වල කණිෂ්ඨ ද්විතියික අවධියට ඇතුළත් කර ඇති ශ්‍රේණි කවරේ ද?
   (1) 6, 7, 8 ශ්‍රේණි   (2) 5, 6, 7 ශ්‍රේණි
   (3) 8, 9, 10 ශ්‍රේණි   (4) 9, 10, 11 ශ්‍රේණි (.........)

14. සැමට ද්විභාෂා අධ්‍යාපනය ලෙස පිළිගෙන ක්‍රියාත්මක කර ඇත්තේ මින් කුමක් ද?
   (1) සිංහල හා දෙමළ ඉගැන්වීම   (2) සිංහල හෝ දෙමළ සමග ඉංග්‍රීසි ඉගැන්වීම
   (3) මව්බසින් හා කැමති බසකින් ඉගැන්වීම   (4) සිංහල සමග ඉංග්‍රීසි ඉගැන්වීම (.........)

tamilguru.lk

15. ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනයට අයත්වන අවස්ථා වන්නේ මොනවා ද?
   (1) ප්‍රාථමික අධ්‍යාපනයේ සිට ද්විතියික අධ්‍යාපනය තෙක්
   (2) පාසල් අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය
   (3) පළමුවන ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි අධ්‍යාපනය තෙක්
   (4) ප්‍රාථමික අධ්‍යාපනය හා තෘතීය අධ්‍යාපනය (.........)

16. පළමුවන ශ්‍රේණියට සිසුන් බඳවා ගැනීමේ පදනම් අතුරින් වැඩිම ප්‍රතිශතයක් හිමි පදනම් දෙක මොනවා ද?
   (1) ප්‍රදේශයේ පදිංචිය හා ආදිශිෂ්‍ය මව්පිය පදනම
   (2) නේවාසික පදනම හා ආරක්ෂක සේවාවල නිරත වීමේ පදනම
   (3) අධ්‍යාපන ආයතනවල සේවා නියුක්තිය හා සහෝදර ශිෂ්‍ය පදනම
   (4) විදේශගතව සිට පැමිණි අයගේ දරුවන් හා නේවාසික පදනම (.........)

17. ජාතික කියවීමේ මාසය ලෙස ඔක්තෝබර් මාසය නම්කර ඇත්තේ කුමන ආයතනය මගින් ද?
   (1) ජාතික අධ්‍යාපන ආයතනය
   (2) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
   (3) ජාතික අධ්‍යාපන සේවා කොමිෂන් සභාව
   (4) අන්තර්ජාතික ළමා අරමුදල (.........)

18. ශ්‍රී ලංකාවේ පාසලක් තුළ ක්‍රියාත්මක වන තනතුරු ආරෝහණ පිළිවෙළින් සඳහන් වන වරණය කුමක් ද?
   (1) අංශභාර ප්‍රධාන, විෂයභාර ප්‍රධාන, ශ්‍රේණි ප්‍රධාන, පන්තිභාර ගුරු
   (2) ශ්‍රේණි ප්‍රධාන, පන්තිභාර ගුරු, විෂයභාර ගුරු, නියෝජ්‍ය විදුහල්පති
   (3) විෂයභාර ගුරු, පන්තිභාර ගුරු, උප විදුහල්පති, අංශභාර ගුරු
   (4) පන්තිභාර ගුරු, විෂයභාර ප්‍රධාන, අංශභාර ගුරු, නියෝජ්‍ය විදුහල්පති (.........)

[ 4 වැනි පිටුව බලන්න.

19. රජයේ පාසල්වල නිලවශයෙන් සේවය කරන විදුහල්පතිවරුන් අයත්වන සේවාවක් වන්නේ මින් කුමක් ද?

(1) ගුරු උපදේශන සේවය (2) ගුරු අධ්‍යාපනඥ සේවය
(3) අධ්‍යාපන පරිපාලන සේවය (4) රාජ්‍ය පරිපාලන සේවය (.........)

20. වත්මන්හි ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අයත්වන අමාත්‍යාංශයේ නම කුමක් ද?

For More Past Papers
tamilguru.lk

(1) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
(2) සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
(3) විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
(4) ආගමික කටයුතු අමාත්‍යාංශය (.........)

21. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ තීරණය කරන ප්‍රධාන ආයතනය කුමක් ද?

(1) ජාතික අධ්‍යාපන ආයතනය (2) අධ්‍යාපන අමාත්‍යාංශය
(3) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම (4) ජාතික අධ්‍යාපන කොමිසම (.........)

22. පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රධාන අරමුණු කවරේ ද?

(1) හොඳම සිසුන් තෝරා ත්‍යාග පිරිනැමීම හා ශිෂ්‍යත්ව ලබාදීම
(2) හොඳ පාසල් ලබාගැනීම හා පාසලේ කීර්තිනාමය රැකගැනීම
(3) ශිෂ්‍යාධාර ප්‍රදානය හා පාසල්වලට සිසුන් තෝරාගැනීම
(4) අනාගත අධ්‍යාපනයට පදනම සැකසීම හා සිසුන් පෙළඹවීම (.........)

23. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සඳහා විෂයයන් 3 ක් පදනම් කරගෙන පළමුවරට විභාගය පැවැත්වූයේ කුමන වසරේ දී ද?

(1) 2000 (2) 2001 (3) 2002 (4) 2004 (.........)

tamilguru.lk

24. පාසල් සංවර්ධනය සඳහා ක්‍රියාකාරී වීමට වර්තමානයේ තෝරාගෙන ඇති සංකල්පය කුමක් ද?

(1) ළමා මිතුරු පාසල (2) ළඟම පාසල හොඳම පාසල
(3) නවෝදය පාසල (4) හොඳම ද්විතියික පාසල (.........)

25. යම් රටක අධ්‍යාපන මට්ටම තක්සේරු කර ගැනීම සඳහා බොහෝවිට උපයෝගී කර ගනු ලබන ජනප්‍රිය දර්ශකය කුමක් ද?

(1) ජනගහනයට සාපේක්ෂව පාසල් ඇති ප්‍රමාණය
(2) ගුරු වෘත්තියට බඳවා ගන්නා ප්‍රමාණය
(3) අකුරු කියවීමේ හා ලිවීමේ හැකියාව
(4) ජාතික විභාගවලින් සමත්වන ප්‍රතිශතය (.........)

26. ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපනයට අන්තර්ගත අධ්‍යාපන අවස්ථා නිවැරදිව ඇතුළත් වරණය කුමක් ද?

(1) ළදරු අධ්‍යාපනය, පෙරපාසල් අධ්‍යාපනය, ද්විතියික අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය
(2) ප්‍රාථමික අධ්‍යාපනය, කනිෂ්ඨ ද්විතියික අධ්‍යාපනය, ජ්‍යෙෂ්ඨ ද්විතියික අධ්‍යාපනය, විශ්වවිද්‍යාල අධ්‍යාපනය
(3) මූලික අධ්‍යාපනය, ද්විතියික අධ්‍යාපනය, තෘතියික අධ්‍යාපනය, අඛණ්ඩ අධ්‍යාපනය
(4) මූලික අධ්‍යාපනය, ප්‍රාථමික අධ්‍යාපනය, ද්විතියික අධ්‍යාපනය, වෘත්තීය අධ්‍යාපනය (.........)

27. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) අසමත්වන සිසුන් සඳහා වර්තමානයේ ජාතික මට්ටමින් ඉදිරිපත් කර ඇති විසඳුම කුමක් ද?

(1) කාර්මික විද්‍යාලවල වෘත්තීය පුහුණුව ලබාදීම
(2) යොවුන් සේනාංකයට බඳවා ගැනීම
(3) තවත් වසර දෙකක් පාසල් අධ්‍යාපනය ලබාදීම
(4) පෞද්ගලික අධ්‍යාපන ආයතන ඇරඹීමට අවස්ථාව ලබාදීම (.........)

[ 5 වැනි පිටුව බලන්න.

For More Past Papers
**tamilguru.lk**



28. වර්තමාන පාසල් පද්ධතියේ සිදුවෙමින් පවතින කැපීපෙනෙන ප්‍රවණතාවක් වන්නේ මින් කුමක් ද?
    (1) සියලු විභාගවලින් අසමත් ප්‍රතිශතය වැඩිවෙමින් පැවතීම
    (2) අතරමග පාසල හැරයන ප්‍රතිශතය අඩුවෙමින් පැවතීම
    (3) ඉල්ලුමට ප්‍රමාණවත් නව පාසල් විවෘත වෙමින් පැවතීම
    (4) දිනපතා පාසලට නොපැමිණෙන ප්‍රතිශතය වැඩිවෙමින් පැවතීම (.........)

29. වත්මන්හි ජගත් නිර්ණායකවලට අනුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතුරින් ප්‍රමුඛත්වය ලැබී ඇති විශ්වවිද්‍යාලය කුමක් ද?
    (1) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
    (2) මොරටුව විශ්වවිද්‍යාලය
    (3) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
    (4) කොළඹ විශ්වවිද්‍යාලය (.........)

30. පාසලක් දියුණු කිරීම සඳහා ප්‍රජාව සම්බන්ධ කර ගනිමින්, බොහෝ පාසල්වල පිහිටුවා ඇති පුළුල් සංවිධානය කුමක් ද?
    (1) පාසල් සංවර්ධන සංගමය
    (2) පාසල් සුබසාධක සංගමය
    (3) ගුරුදෙගුරු සංගමය
    (4) පාසල් සංවර්ධන මණ්ඩලය (.........)

- අංක **31** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර දී ඇති තිත් ඉර මත ලියන්න.

31. වර්ෂ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනයට අනුව, පෙර පාසල් අධ්‍යාපනය සැපයීම අයත් වන්නේ කුමන ආයතනයට ද?

    ......................................................................................................................................

32. සාමාජික රටවල අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රතිපත්ති, විෂයමාලා සංවර්ධනයට මගපෙන්වීම හා උදව්කිරීම සිදු කරන ජගත් ආයතනය නම් කරන්න.

    ......................................................................................................................................

33. වත්මන්හි අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්තාවලට අනුව වාර්ෂිකව වැඩිම ගුරු පුරප්පාඩු පවතින්නේ පාසල් අධ්‍යාපනයේ කවර අංශය තුළ ද?

    ......................................................................................................................................

34. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සමත් සිසුන් ගුරුවෘත්තියට බඳවා ගැනීම සඳහා පුහුණු කිරීමට පිහිටුවා ඇති අධ්‍යාපන ආයතන පොදුවේ හඳුන්වන්නේ කෙසේ ද?

    ......................................................................................................................................

35. උපාධිධාරීන් ගුරුවෘත්තියට පැමිණීමෙන් පසුව වෘත්තීය සංවර්ධනය සඳහා මුලින්ම හැදෑරිය යුතු උපාධි පාඨමාලාව කුමක් ද?

    ......................................................................................................................................

36. රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පාලනය වන පාසල් හඳුන්වන්නේ කුමන නමකින් ද?

    ......................................................................................................................................

37. පසුගිය වසර අවසානය වන විට ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ගුරු සංඛ්‍යාව ආසන්න වශයෙන් කොපමණ වේ ද?

    ......................................................................................................................................

38. ශ්‍රී ලාංකික ජනතාව නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස හඳුන්වන්නේ කවුරුන් ද?

    ......................................................................................................................................

[ 6 වැනි පිටුව බලන්න.

tamilguru.lk

39. ඉහළම සාක්ෂරතා ප්‍රතිශතයක් පවතින සාක් කලාපීය රාජ්‍යය නම් කරන්න.

..............................................................................................................................

40. ශ්‍රී ලංකාවේ පළමු ශ්‍රේණියට වාර්ෂිකව ප්‍රවේශ වන ශිෂ්‍ය සංඛ්‍යාව දළ වශයෙන් කොපමණ වේ ද?

..............................................................................................................................

41. අධ්‍යාපනය ලැබීම සඳහා ලොව සියලු දෙනාට ම සමාන අයිතියක් ඇති බව 1948 දී තහවුරු කර ඇති ප්‍රකාශය නම් කරන්න.

..............................................................................................................................

42. ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව සංවර්ධනය සඳහා කටයුතු කරන ප්‍රධාන ආයතනය කුමක් ද?

..............................................................................................................................

43. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සිසුන්ගේ අමතර දැනුම ඇගයීම සඳහා 2000 වසරේ සිට හඳුන්වා දී ඇති පරීක්ෂණය නම් කරන්න.

..............................................................................................................................

44. වර්තමාන ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තියක් ලෙස විශ්වවිද්‍යාල සිසුන්ගේ සුබසාධනය සඳහා රජයෙන් ලබාදෙන ආධාර වර්ගයක් නම් කරන්න.

..............................................................................................................................

45. මෑත කාලයේ හඳුන්වාදුන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් වන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයක් නම් කරන්න.

..............................................................................................................................

46. ශ්‍රී ලංකාවේ පාසල් සිසුන්ගේ සෞඛ්‍යය සම්බන්ධයෙන් මතුවී ඇති ප්‍රධාන ප්‍රවණතාව කුමක් ද?

..............................................................................................................................

47. පාසල් සිසුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් මෑත කාලයේ රජය මගින් ආරම්භ කරන ලද රක්ෂණ ක්‍රමය කුමන නමකින් හැඳින්වේ ද?

..............................................................................................................................

48. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන නවීකරණ හඳුන්වා දීමේ වගකීම පැවරී ඇති ආයතනය හඳුන්වන නම කුමක් ද?

..............................................................................................................................

49. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සමත් නොවූ සිසුන් තවදුරටත් පාසල් අධ්‍යාපනයට සම්බන්ධ කර ගැනීමට ක්‍රියාත්මක වන වැඩපිළිවෙල හඳුන්වන්නේ කවර නමකින් ද?

..............................................................................................................................

50. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සංවර්ධනය සඳහා ආධාර සපයනු ලබන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතායතනයක් නම් කරන්න.

..............................................................................................................................

* * *

For More Past Papers
**tamilguru.lk**